[සියලු හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

71 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

සිංහල	I	පැය තුනයි
சிங்களம்	I	மூன்று மணித்தியாலம்
Sinhala	I	Three hours

* පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(අ) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨවල **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් පාඨ ගතරක අර්ථ ලිහිල් බසින් ලියන්න. **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන සඳහා ඔබ දෙන අර්ථ යටින් ඉරි අඳින්න.

(i) මුට එක් දවසක් මස්රසයක් පිසූ කලට රහත්කෙනෙක් සිහා ඇවිදිනෝ මුගේ ගෙදෙරට ගියෝ ය. තෙමේ උන් දැක පැහැද "අනේ බොහෝ ප්‍රාණවට කෙළෙමි. මුන්වහන්සේත් මාගේ ගෙදොරට සිහා වැඩි සේක. ගෙයි මස්රසයකුත් ඇත. මසවුළෙන් යුක්ත කොට බතක් දන් දෙමි." ආරාධනා කොට පාත්‍රය හැරගෙන මස්රසයෙන් යුත් බත්පාත්තරය පිළිගන්වා ලා රහත් තෙරුන් පසඟ පිහිටුවා වැඳගෙන "ස්වාමිනි, නුඹවහන්සේ ලත් නිවන්රස මදු දුන්, මස්රසයෙහි **මුඛ්‍යවපාකයෙන්** මටත් වෙව"යි පැතුයේ ය. රහත් තෙරහුත් ඒ එසේ ම වෙවයි කීහ. මහණෙනි, එකල පක්ෂීන්ගේ ඇට බිඳවූ ලෙසට මුගේ ශරීරයත් කුණු විය. ඇටත් බුණු, රහතුන්ට දුන් බතෙහි අනුභසින් නිවන්රස ලද"යි වදළ සේක.

නැතහොත්

මුන් නරම් සරුසාරකෙනෙක් නැත. යතළිස්කෙළක් චිතර වස්තු ඇතිවත් **ඉපිල්ලවාසී කමෙන්** වේවයි අභිමානයෙක් වේවයි නැත. කිසිවක් නැති දුක්පත් එකක්හු මෙන් රෙදි කවක් හැඳගෙන බැළවිටියෙහි බැළයන්ට බැළමේ කොටලා හිඳිති. මම මුන් හඬගා ඇවිදිනා කටහඬින් ම සධනී නියාව දැන මෙසේ වූ උපදෙසින් ගෙන්වාගෙන වස්තු ඇති නියාවට ඉන් එවූයාත් රත් පැලා උන් ම ඔවිස්ථලා ඒ වස්තුව ගෙන්වාගෙන සිටුදෝයත් දෙවාලා උන්ගේ සම්පත. උන්ට ම දෙවාලා නිලකොට මුන්ගේ තරම් දැන අපගෙන් දුවනි කෙනකුන් මුන්ට පාවා දෙවාලා බන්ධුන් කොට ගනිමි.

(ii) ඉක්බිති සර්වඥයන් වහන්සේ පෙරයම් දසපැය භික්ම ගිය භික්ෂූ භික්ෂුණී උපාසක උපාසිකා යැයි යන සිව්වනක් පර්ෂදට අභිප්‍රායානුකූල වූ ධර්ම දේශනා කොට මැදියම් දසපැය දී දිව්‍ය බ්‍රාහ්මාදී දෙවියන්ගේ ප්‍රශ්න විසර්ජනය කිරීමෙන් බණ වදරා අලුයම් දසපැය පළමු වන කොටියාසය සිංහසෙය්‍යාවෙන් සැතපී වැඩ හිඳ දෙ වන කොටස ඵල සමාපත්තියෙන් වැඩ තුන් වන කොටියාසයෙහි මහා කරුණා සමාපත්තියට සමවැද සමාපත්තියෙන් නැගී මාගෙන් බණ අසා මාර්ග ඵලයට පැමිණෙන්ට නිස්සෝ කවුරු දේ හෝ යි වෙනෙයපුඛ්ගලයන් බලා වදළ සේක්, නාලාගිරි දමනය නිසා සුවාසූදහසක් සත්වයෝ නිවන් දකින්නාහු යැයි දැන ඒ රාත්‍රිය ඉකුත් ව අරුණු නැගි කල්හි සිරුරු පිළිදගුම් කොට ආයුෂ්මත් වූ අනඳ මහතෙරුන් වහන්සේට නියෝග කොට රජගහ නුවර වට අවලොස් විහාරයෙහි වසන ඇම භික්ෂූන් රැස් කරවා, සික්ෂූ සංඝයා වහන්සේ පිරිවරා සර්වඥරාජෝත්තමයන් වහන්සේ එදවස් රජගහ නුවරට වන් සේක.

(iii) උදකලා ව වාසය කැමති ව වලට වැද වනයෙහි සැදහැ ඇති උපාසකවරුන් විසින් කරවා පිළිගන්වන ලද පන්සලක වස් වැස වස් තුන් මස මුඵල්ලෙහි මාර්ග ඵල උපදවන්නට උත්සාහ කරන සේක් විදර්ශනා ලෝකයක් වේව යි ප්‍රතිභාග නිමිත්තක් වේව යි උපදවා ගත නොහී මෙසේ සිතූ සේක. සර්වඥයන් වහන්සේ විසින් පුද්ගලයෝ සතර දෙනෙක් වදරන ලදහ. ඔවුන් යතර දෙනා අතුරෙන් මා **පදපරම** වන්ට කාරණා වන්නේ ය. මට මේ ආත්මභාවයෙහි මාර්ගයෙක් වත් ඵලයෙක් වත් නැතැ'යි සිතමි. එසේ හෙයින් මේ වනයෙහි වැස කුමක් කෙරෙමි ද? සර්වඥයන් වහන්සේ යම්පයට ගොස් රූනාගුප්‍රාප්ති වූ බුදුන්ගේ ශරීරය බැබලා මිහිරි වූ බණ අසමින් විසුයෙමි වීමි නම් යහපත් වන්නේ යැයි. සිතා නැවත ජේතවනාරාමයට වැඩී සේක.

(iv) ගනේ ඕනිං බැබළි කිරණෙවි — ධාතුපාය
රනේ යටග සැවුලිදු දද — ගළපාය
අනේ ලකර කළ පුර අප — නරපාය
පෙනේ දකුණු මහසෙන් දෙවි රද — පාය

(v) මහනිලමින් සිටි නා දෙඹ නී — පියල
පියසලමින් මලගෙහි කෙළ — රොනිනාවල
කකුඩලමින් බිඳ විලිකුන් මියුරු — පල
ඉසුඹුලමින් යා සැළ දඹ — පඳුරුවල

(ආ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "සටනක් පැමිණි අවස්ථාවෙහි සටන ජය ගන්ට නිසි සූර වීර යෝධ භටයෝ විය යුත්තාහු ය"
(ii) "අපට අවකාශ දුන මැනව. ඔබ්බකට ගොහින් වාසය කරමිහ"
(iii) "ඇයි බැරි? සමාජයේ පයට පැගෙන මිනිස්සුන්ට සේවය කරන්න එයාට බැරි ද?"
(iv) "අසනීපයක් නැති නම් කොහොම ද සනීපයක් දනෙන්නෙ"
(v) "නොතළෙනුය මා දුබල ජීවය"

(ලකුණු 12 යි)

(ඉ) පහත දක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් ඉපයන්න.

මා හැර දා
දරදඬු කොට දා මා අත් පා,
ඈ යන්න ගියා මැකිලා
ඈ යන්න ගියා.
සැමරුම් වග වලසුන් රැනට
මා ගොදුරක් වී
ලේ ගලනා ගොදුරක් වී.

කාලය ගත අඳුරින් වැසුණත්
සෙලවෙන හදවත පහනෙහී පිලුවෙන්
ඇ ගත දිලිසෙයි
දැසට දිස් වෙයි
ගොරහැඩි ගල්ගෙඩි අතරින්

ඈ
සීතල දියර ඉරක් සේ
ගලා බසී
හද තෙමා බසී

ඉරිසිදු අහසෙහි පැහැය ඇගෙයි
ගස්වල මල්වල පැහැය ඇගෙයි
මුලු ලෝකෙම හැම පැහැය ඇගෙයි

කොතෙකුත් දහලුවත් සැහවෙන්නට
ඇයිසිය දල්වල මයි ඇය දවටුම
අමතක භාවයෙ අන්ධකාරයේ
දෙබෑ කරන් වේලුණ ගත හම
එහී බලයි සොඳුරිය ඔබ ඇස් දෙස
තොල් දෙක සෙලවුම තවම පෙනෙනවා
හීන්සැරේ මා වැලඳ ගන්නවා

ජීවිතයට ඇති එක ම සොඳුරු බව
ලෝකයට ම ඇති රුමත් එක දෙය
ඈ මයි තනිවට හිටි එක ගැහැනිය
මැකී ගියත් තනිවට හිටි ගැහැනිය

(ලකුණු 12 යි)

2. "ධර්මසේන හිමියන්ගේ කථා ශෛලියෙහි විශේෂ ලක්ෂණයක් වන්නේ, චරිත හා අවස්ථා නිරූපණයේ දී ස්වාධීන මගක් ගෙන ශ්‍රාවකයාගේ සිත් ගන්නා පරිදි කරුණු ඉදිරිපත් කිරීම ය." මෙම කියමන සද්ධර්මරත්නාවලියෙහි නියමිත කථාවස්තු දෙකක්වත් ඇසුරු කොට නිදසුන් සහිත ව විභාග කරන්න. (ලකුණු 15 යි)

නැතහොත්

"ජාතක කථාවල දක්නට ලැබෙන්නේ, සර්වකාලීනවූත් විශ්වජනීයවූත් සංකීර්ණ මනුෂ්‍ය ගති ස්වභාවයන් ය" නියමිත ජාතක කථා දෙකක්වත් ඇසුරු කොට නිදසුන් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

3. "කවියාගේ සූක්ෂම නිරීක්ෂණශක්තිය හේතුවෙන් සැලෙලිහිණි සන්දේශය රසවත් කාව්‍යයක් වී ඇත." වර්ණනා තුනක්වත් පදනම් කොට ගෙන ඉහත කී අදහස පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

4. ධනපති පන්තිය කුළින් පහළ වූ නමුත් විප්ලවකාරී අදහස්ඇති නරුණයකු වූ මාලින් තමා අයත් පන්තියට එරෙහිව නැගී සිටින ආකාරය, යුගාන්තය නවකතාවෙහි එන චරිත තුනක්වත් පදනම් කොට ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

5. "මාර්ටින් වික්‍රමසිංහයන්ගේ "නරක් වී ගිවී බදුන", දරුවන් කෙරෙහි ආදරයක් ඇති මව්කාගේත් මසුරු පියකුගේත් චරිත මැනවින් නිරූපණය කෙරෙන ගැම්මපරයය මත පදනම් වූ කෙටිකතාවක් ලෙස අගය කළ හැකි ය." විමසන්න. (ලකුණු 15 යි)

6. "කාව්‍ය නිර්මාණයක අරමුණ විය යුත්තේ, පාඨකයා තුළ චිත්දනයක් ඇති කිරීම මෙන් ම සංකීර්ණ ජීවිත යථාර්ථය විශ්වාස කළ හැකි ආකාරයට ඉදිරිපත් කිරීමත් ය." නූතන පද්‍ය සංග්‍රහය ඇසුරෙන් නිදසුන් තුනක්වත් ඇතුළත් වන සේ මෙම අදහස පිරිස්සන්න. (ලකුණු 15 යි)

7. "මනිසා යියඳිච්ච කාලය ඇතුළත ගැටලුවලට මුහුණ දෙන්නේ අනපේක්ෂිත ආකාරයට ය." මනමේ නාට්‍යයෙහි එන එවැනි අවස්ථා තුනක් ඇසුරෙන් මේ අදහස යාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

www.pastpaperlk.com
www.artsapi.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

71	S	II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஒகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

සිංහල சிங்களம் Sinhala	II II II	පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours

* 1, 2, 3 ප්‍රශ්න අතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දක්වෙන ව්‍යුහගත ඡේද අතුරෙන් **එකක්** තෝරාගෙන වචන 250 - 300 ක් අතර වන සේ **රචනාවක්** ලියන්න. යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

   (i) දේශීය වශයෙන් බෞද්ධවාදී ත්‍රස්තවාදය ලන්දිවින් අවසන් කළ පදු වෙනත් මුහුණුවරින් එය යළි පණ ගැන්වීමට දේශීය හා විදේශීය වශයෙන් කුමන්ත්‍රණ හා වෙනත් බලවේග පවත්නා බවට බොහෝ විද්වත්හු මත පළ කරති. මෙහි ඇති සත්‍යාසත්‍යතාව කවරේද'යි විමසමින් රචනයක් ලියන්න.

   (ii) ලංකාවේ පවත්නා විවිධ භූවිෂමතා ලක්ෂණ, දේශගුණික ලක්ෂණ හා ඓතිහාසික උරුමය නියා පමණක් නොව විශේෂයෙන් පසුගිය ද ඇති වූ ආපදාමකාමී පරිසරය නියාත් ලක්දිව සඤ්චාරක කර්මාන්තය වේගයෙන් සංවර්ධනය වන බව පැහැදිලි ය. එයින් අපට විදේශ විනිමය ලැබීම ද රැකියා බහුල වීම ද සිදු වේ. මෙය රටට වඩාත් අර්ථවත් වන පරිදි සකස් විය යුත්තේ කෙසේද'යි ප්‍රායෝගික ව කරුණු සාකච්ඡා කරමින් රචනයක් ලියන්න.

   (iii) පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම වසරක් පාසා ලක්දිව දෙමාපියන් මුහුණ පාන මහත් ගැටලුවකි. එය ඇතැම්විට සංවේගදායක වූ සිද්ධියත් ද වෙයි. කවද හෝ මේ සම්බන්ධ ව ස්ථිරසාර අර්ථවත් ප්‍රායෝගික විසඳුම් ලැබිය යුතු ය. මේ සඳහා ඔබ ඉදිරිපත් කරන ප්‍රායෝගික වැඩ පිළිවෙළ පහදමින් රචනාවක් ලියන්න.

   (iv) "කලා නිර්මාණයක අරමුණ විය යුත්තේ රසිකයාගේ චින්තන ශක්තිය ද ජීවිතාවබෝධය ද ප්‍රඥව ද පුබුදු කිරීම ය." මෙම කියමන ගැන ඔබේ අදහස් ඉදිරිපත් කරමින් රචනාවක් ලියන්න.

   (v) ලොව බොහෝ සංවර්ධිත රටවල ආර්ථිකය අවපාතයකට ලක් වූ බව ප්‍රසිද්ධ ය. විරැකියාව හා සමාජ අසහනය ඉන් ඇති වූ ප්‍රබල විපත් ය. මෙසේ සිදුවීමට බල පෑ හේතු සමූහයකි. එකී හේතු පහදමින් රචනාවක් ලියන්න.

   (ලකුණු 25 යි)

2. (අ) පහත දක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   "කාව්‍යයෙහි නැනහොත් වෙන යම් කලා නිර්මාණයක කාර්යය නම් අර්ථප්‍රකාශනය යි කිව හැකි ය. එනම් භාව හා අනුභූතීන්ගේ ප්‍රකාශනය යි. සංස්කෘත සාහිත්‍ය විචාරකයින් මේ ප්‍රවෘත්තිය හැඳින්වූයේ රස නිෂ්පත්ති යන නමිනි. කවියා විසින් ස්වකීය අපූර්ව ප්‍රතිභානය මඟින් සහෘදයා හමුවෙහි තබන ලද්ද වූ අනුභූතිජන්‍ය භාවයන් හා මනෝවෘත්තීන් සහෘදයා ආතන්ද්දයෙන් පසක් කොට වමත්කාරයක් විඳීම මෙය යි. රස නිෂ්පත්තිය සිද්ධ වීමේ මාර්ගය ධ්වනිය යි - ඒ සඳහා සමත් ඵාම මාර්ගය ද එය පමණි. අභිධා ව්‍යාපාරය - වාචක ශක්තියෙන් අරුත් දැනවීම - වැනි ඕලාරික මාර්ගයක් එම කාර්යයෙහි දී අනිවාර්යයෙන් ම අසමත් වෙයි. අලංකාරෝක්ති, ශබ්දලංකාර, රීති, වක්‍රෝක්ති ආදී දේ අප්‍රධාන කාව්‍යාංග වෙයි. ඒ සියල්ල ඖචිත්‍යය පිළිබඳ නිසි සැලකීමෙන් යුතු ව යෙදුව කල්හි ධ්වන්‍යුත්පාදක ධර්මතා බවට පත් වෙයි. තව ද රස නිෂ්පත්තියට සාධක වැන විභාවානුභාවාදිය ද ස්වකීය කර්තව්‍යය හරිහැටි ඉටු කරන්නේ උචිත ලෙස භාවිත කරනු ලැබුවහොත් පමණි. මෙසේ රස, ධ්වනි, ඖචිත්‍යය යන සංකල්පත්‍රයේ සීමාවන් තුළ, සංස්කෘතයේ කාව්‍ය විචාර චින්තනය සාකල්‍යයෙන් ග්‍රහණය කළ හැකි වේ."

   (i) මේ ඡේදයට අනුව වමත්කාරයක් විඳීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

   (ii) වාචක ශක්තියෙන් අරුත් දැනවීමෙන් වමත්කාරය ජනිත **නො වන්නේ** ඇයි?

   (iii) කාව්‍යාංග ධ්වන්‍යුත්පාදක ධර්මතා බවට පත් වන්නේ කෙසේ ද?

   (iv) රස නිෂ්පත්තිය සිදුවීමේ අසහාය මාර්ගය කුමක් ද?

   (v) භාව හා අනුභූතීන්ගේ ප්‍රකාශනය යනු කුමක් ද?

   (ලකුණු 10 යි)

   (ආ) "අ.පො.ය. උසස් පෙළ තෙක් මා ලද අධ්‍යාපනයෙහි යථාර්ථත්වය විමසීමක්" යන මැයින්, ලිඛිත ව්‍යාකරණානුකූල සිංහල භාෂාවෙන් (කටවරින් නො වේ.) ඔබේ පාසැල් සහරාවට ලිපියක් ලියන්න. (මේ සඳහා වචන 150 ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.)

   (ලකුණු 15 යි)

[දෙවෙනි පිටුව බලන්න.

3. (අ) පහත දක්වෙන එක් එක් වාක්‍යයක, එක් පදයක අක්ෂර වින්‍යාසය **සදෙස් ය.** ඒ පදය පමණක් **නිවැරදි** කොට ලියන්න.

(i) අළු යට වූ ගිනි පුපුර අළුයම් කල ඇවිලිණ.
(ii) කොළඹින් පිටත් වූ සීඝ්‍රගාමී අධිසුඛෝපභෝගී බස් රිය අපේක්ෂිත වේලාවට පෙර යාපනයට ළඟා විය.
(iii) පෘතිවියේ උෂ්ණත්වය වැඩිවීම අද ලොව ම මුහුණ දී ඇති බලවත් ප්‍රශ්නයකි.
(iv) ඔහු අග්‍රගණ්‍ය ප්‍රවීන ජනමාධ්‍යවේදියෙකි.

(ආ) පහත දක්වෙන පද්‍යයෙහි පද බෙද ඇති ස්වරූපය පදනම් කොට ගනිමින්, එහි පද **අකාරාදි** පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

"පරෙයි ජෝඩුවක් ඇවිදින් අපේ ගෙදර නවතින්නට
බලපන්කෝ යට ලීයට වෙලා ඉන්න හැටි කදිමට"

(ඉ) පහත දක්වෙන පද **සන්ධි** කරන්න.

(i) තත් + ආශ්‍රිත
(ii) පිරි + අත්
(iii) ගෘහ + උපකරණ
(iv) සිත් + කරු

(ඊ) පහත දක්වෙන පද **විසන්ධි** කරන්න.

(i) උමාහන
(ii) කුනුවහ
(iii) රුක්කත්තන

(උ) "නගර" යන්නෙන් "නාගරික" යන පදය සෑදෙන්නාක් මෙන් "භූත" යන්නෙන් යෑදෙන පදය කුමක් ද?

(ඌ) "ඇසල මස / ඇසළ මස" යන පද දෙකින් නිවැරදි පදය කුමක් ද?

(එ) "ගැටිති" යන පදයෙහි ඇතුළත් තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?

(ඒ) "ලිය කොමළ" යනු කවර වර්ගයේ සමාස පදයක් ද?

(ඔ) පහත දක්වෙන පද්‍යයෙහි තද කළු යෙදුම් දෙකෙහි අර්ථ පැහැදිලි කරන්න.

(i) "**දෙනතුල් සේ** ඉසට
(ii) **සතින් වළකන** චැස්සට
යෙදෙන මහතුන් හට
දෙයක් නො යොදති හීනයන්හට"

(ඕ) පහත දක්වෙන වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස් කරන්න.**

(i) ලක්දිව ගොවියෝ කෘෂි කර්මයෙන් රට ස්වයංපෝෂිත කරාවි.
(ii) පෙර දිනවත්තු වූ මවුහු වත්මනෙහි ගෙන් ගෙට සිහා යති. (ලකුණු 20 යි)

4. (අ) පහත දක්වෙන නාම පදවලට මුල් වුණු **ප්‍රකෘති රූප** වෙන් කොට දක්වන්න.

(i) දුන්නෙන් (ii) යෑතුරෙක් (iii) කැස්බාවාට
(iv) ඉඹිබාගේ (v) යතුන් (vi) ළමයෝ

(ආ) පහත දක්වෙන පදවල **උක්ත විභක්ති පදස්** අනුක්ත විභක්ති පදස් වෙන් කොට ලියන්න.

(i) මොනරුන් (ii) ගොබෙයියෝ (iii) පොකිරිස්සන්
(iv) එළුවෝ (v) කලවැද්දන් (vi) බකමූණෝ

(ඉ) පහත දක්වෙන පදවලට අනුරූප **පූර්ව ක්‍රියා පද** ලියන්න.

(i) කවයි (ii) අඹදී (iii) උගනී
(iv) සීනයි (v) පොවයි (vi) තබයි

(ඊ) පහත දක්වෙන පදවල ඇතුළත් වන **උපසර්ග** වෙන් කොට දක්වන්න.

(i) උදුල (ii) නිමල (iii) දුර්ග
(iv) ප්‍රයෝජන (v) විගමන (vi) සම්බන්ධ

(උ) පහත දක්වෙන නාම පදවල ඇතුළත් වන **තද්ධිත ප්‍රත්‍යය** වෙන් කොට දක්වන්න.

(i) යැයි (ii) පොත්පුලන (iii) මුහුළෙ
(iv) ඇදිරි (v) කළුවී (vi) ඉසුරුමත් (ලකුණු 15 යි)

www.pastpaperlk.com
www.artsapi.lk

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **සඳෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.

(i) වික දෙනෙක් කුසල් කරයි.

(ii) විශේෂඥ වෛද්‍යවරුතුමා රෝගියා මරණින් මුදයි.

(iii) ව්‍යාපාරිකයෝ කම්කරුවෝ ලවා මැණික් ගරුත්.

(iv) වෙරයෝ ගෙට පනිති යි සිතූ ඔහු තිදි වරම්හ් රැය පහන් කෙළේ ය.

(v) ගුරුවරු නිසි මහ පෙන්නුවි ද ඇතැම් සිසුහු එමහ නො යත්.

(ආ) නිදහැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය **වරහන් තුළින්** තෝරා ලියන්න.

(i) (සිසුවෙක් / සිසුවකු) කාලය කළමනාකරණය කරගන්නේ කෙසේ ද?

(ii) (මාර්වින් වික්‍රමසිංහයෝ / මාර්වින් වික්‍රමසිංහයන්) බොහෝ අගනා ග්‍රන්ථ නිර්මාණය කළ විශ එ පවසත්.

(iii) පමුදුර පරයන වැව් (යැදුවේ / යැදුවෝ) ආදී සිංහලයෝ වෙති.

(iv) කවුරු නම් දේශ ද්‍රෝහීන්ගේ බසට (රැවටේ / රවටෙත්) ද?

(v) සුළඟට ගස ද වැල ද බිම පතිත (වුහ / විය.)

(ඉ) පහත දක්වෙන වාක්‍ය, **කර්ම කාරකයට** හරවන්න.

(i) වැඩිමහල් සොහොයුරා සිය බාල සොහොයුරිය රැක්කේ ය.

(ii) දෙබරු සීගිරි සෞන්දර්යකයන් දෂ්ට කළහ.

(iii) මව මහත් වෙහෙසක් දරා නංගී ද මා ද ඩෙංගු උණෙන් බේරා ගත්තා ය.

(iv) පැරණි ලක්දිව රජවරු අතිදක්ෂ ශිල්පීන් ලවා ඔහා වාරි කර්මාන්තයන් නිර්මාණය කළාහු ය.

(v) දේශ හිතෛෂියහු ඉතා වැදගත් යෝජනාවන් ඉදිරිපත් කරත්.

(ලකුණු 15

6. පහත දක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) "සිදු වධදිය නො වන - කලපුව සිදෙන දිය මෙන"

(ii) "අනම් පනම් දෙවවා වනම් පනම් අභගත්තා වාගෙ යි."

(iii) "තුන්වේ ඇදුරු පුලතිසිකුල මිණි මිතුරු"

(iv) "අප්පා තැති එකා අප්පා එක්ක ඉදගෙන කන්න ඇවුවා වාගෙ යි."

(v) "අල පත දිය ලෙසට - දැලි තෙල් රජස් හැම විට"

(vi) "දෙළොස් මහේ පාන වගේ"

(vii) "වළ ගොඩ සිටින සේ - සම වේය බෙර ඇස සේ"

(viii) "අපට ඇතියෙන් ගියත් එකයි, අවරෙන් ගියත් එකයි."

(ix) "හරගිරි රසිනුදුල - දිනිසුරු අලකපුරයුරු"

(x) "රට දෙලුයි බල මාළුයි වාගේ"

(xi) "සිතුමිණි බදුරු කළ - කළබු තිළිනෙන් පසු කළ"

(xii) "දහඅට යන්නිය නැටුවත් යතීප කරන්න බෑ."

(xiii) "කැවි කළ රිවි කිරණ - පැවි කළ පැළඳ අබරණ"

(xiv) "තුඩැල්ලාට පැදුර එලුවා වාගෙ යි"

(xv) "පැදි ඉනිසඳ යසුත් - නැව කසුත් කුමි අසුරු"

(ලකුණු 15 යි)

7. (i) "අරුණෝදය", "අලංකාරෝක්ති", "වක්‍රෝක්ති" කවර වර්ගයට අයත් සන්ධි පද ද? මේ වර්ගයේ තවත් **පද දෙකක්** ලියන්න.

(ii) "අතුරු ආන්තරා", "සමිති සමාගම්", "සැක සංකා" යන යුගල පද සැදී ඇත්තේ කෙසේ ද? මේ වර්ගයට අයත් තවත් **පද දෙකක්** ලියන්න.

(iii) "විදමන්", "කියමන්", "හිඟමන්" කවර වර්ගයකට අයත් පද ද? මේ වර්ගයට අයත් තවත් පද දෙකක් ලියන්න.

(iv) "දහම්යොඩ", "මුහුදු දිය", "සරා සද" කවර සමාසයකට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් **සමාස පද දෙකක්** ලියන්න.

(v) "ගුරුන්ව", "ප්‍රියන්ව", "ලඝුන්ව" කවර වර්ගයට අයත් පද ද? මේ වර්ගයට අයත් තවත් **පද දෙකක්** ලියන්න.

(ලකුණු 15 යි)

www.pastpaperlk.com
www.artsapi.lk

8. පහත (i) සිට (iv) තෙක් කොටස්වල දක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
නැතහොත්
(i) සිට (iv) තෙක් කොටස්වලින් දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියා, (v) කොටසට ද පිළිතුරු සපයන්න.

(i) අර්ධානුනාසිකාක්ෂර (පඤ්චක අකුරු)

(ii) ස්ත්‍රී ලිංග ශබ්ද සාධනය (අදළ වර්ග තෘතරක්වත් ලියන්න.)

(iii) පූර්ව ස්වර ලෝප සන්ධිය

(iv) නිපාත (අදළ වර්ග තෘතරක්වත් ලියන්න.)

(v) පහත දක්වෙන පාඨවලින් තෘතරකට සුදුසු ප්‍රස්තාව පිරුළු තෘතරක් දක්වා එයින් එක් ප්‍රස්තාව පිරුළෙන් යොද ගනිමින් එහි අර්ථය ප්‍රකට වන සේ වාක්‍යයක් ලියන්න.

(අ) එක් එක් රටේ වෙන වෙන ම නීති ඇති බව

(ආ) හිතේ එකක් තියා ගෙන වෙනින් එකක් කීම

(ඉ) අනුන්ගේ උදව්වෙන් ජීවත්වීම

(ඊ) වැඩිදුර නොයිකා කළ වැඩකින් පසුතැවීම

(උ) පහත් පෙළේ අයට අණක් ගුණක් නැති බව

(ලකුණු 15 යි)

***

www.pastpaperlk.com
www.artsapi.lk